තිස්ස සෙනෙවිරත්න

අංක 163, උඩුපුස්සැල්ලැව පාර,

හාවාඑළිය,

නුවරඑළිය.

2026.03.06

අධ්‍යක්ෂක ජනරාල්තුමා,

(Commission to Investigate Allegations of Bribery or Corruption)

අල්ලස් හෝ දූෂණ විමර්ශණ කොමිෂන් සභාව,

මලලසේකර මාවත ,

කොළඹ 07,

ගරු මහත්මයාණෙනි,

**<u>නුවරඑළිය ගෝල්ෆ් ක්‍රීඩා සමාජය සම්බන්ධ පරිසර විනාශය හා රාජ්‍ය දේපළ අවභාවිතාවට අදාළ විමර්ශනයේදී ඇති වූ අල්ලස් හා දූෂණ සැකයක් සම්බන්ධ පැමිණිල්ල.</u>**

නුවරඑළිය නගර සභාව විසින් බදු දී ඇති නුවරඑළිය ගෝල්ෆ් ක්‍රීඩා සමාජය භූමිය තුළ සිදුකර ඇති බරපතල පරිසර විනාශයක් සහ රාජ්‍ය දේපළ අවභාවිතාවක් සම්බන්ධයෙන් මා විසින් නුවරඑළිය පොලිසියට, නුවරඑළිය මහ නගර සභාවට සහ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිලි කර තිබේ.

එම පැමිණිල්ල අනුව නුවරඑළිය මහ නගර සභාව, මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ දැව සංස්ථාව යන ආයතන එක්ව ස්ථාන පරීක්ෂාවක් සිදුකර ඇති අතර පහත සඳහන් බරපතල අකටයුතුකම් අනාවරණය වී ඇත.

ග්‍රාන්ඩිස් වර්ගයේ විශාල ගස් පහක් කපා බිම හෙලා එම දැව ගෘහ භාණ්ඩ හා වහල ඉදිකිරීම සඳහා භාවිතා කිරීම.

ගස් 60 කට අධික සංඛ්‍යාවක පොතු හා කැම්බියම් කොටස වලයාකාරව ඉවත් කර Ring Barking ක්‍රමය භාවිතා කර ගස් මරා දැමීමට උත්සාහ කිරීම.

මෙය අඩි 5000 ට ඉහළ පරිසර සංවේදී ප්‍රදේශයක් වන බැවින් හග්ගල උද්භිත උද්‍යානයේ උපදෙස් ලබා ගත යුතු බවට දිස්ත්‍රික් කමිටු තීරණයක් තිබියදී එය නොසලකා හැරීම.

නුවරඑළිය මහ නගර සභාවෙන් හෝ ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් කිසිදු ලිඛිත අවසරයක් ලබා නොගැනීම.

පරිසර ශක්‍යතා වාර්තාවක් ලබා නොගෙන පරිසරයට හානිකර ක්‍රියා සිදු කිරීම.

රාජ්‍ය භූමියක අනවසර දැව ඉරුම් පලක් පවත්වාගෙන යාම.

රාජ්‍ය දේපළ අනීතික ලෙස භාවිතා කර විශාල වටිනාකමක් ඇති දැව පෞද්ගලික ප්‍රයෝජන සඳහා භාවිතා කිරීම.

මෙවැනි බරපතල කරුණු අනාවරණය වුවද 2024.11.20 දින පොලිසිය විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද B වාර්තාව මගින් මෙම සිද්ධිය දණ්ඩ නීති සංග්‍රහයේ සුළු වරදක් (අනර්ථයක් සිදු කිරීම) ලෙස පමණක් වාර්තා කර ඇති බව දැනගැනීමට ලැබේ.

තවද මෙම ඉඩම පුරාවිද්‍යා වටිනාකමක් ඇති සංරක්ෂිත භූමියක් ලෙස ගැසට් කර ඇති බවට ද තොරතුරු ඇති අතර එම සම්බන්ධයෙන් ද Department of Archaeology වෙතින් කිසිදු අවසරයක් ලබාගෙන නොමැත.

**2026.03.06 දින සිදුවූ අල්ලස් සැකය**

මෙම සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකිරීම සඳහා අද දින (2026.03.06) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පිරිසක් අදාළ ස්ථානයට පැමිණ ඇති බවට තොරතුරු ලැබී ඇත.

නමුත් එම නිලධාරීන් විසින් විමර්ශනය නිසි විධිමත් ලෙස සිදු කරනවා වෙනුවට එම චූදිත පාර්ශව විසින් ලබා දෙන ලද දිවා ආහාර (බුරියානි) පිළිගෙන අනුභව කරන බවට තොරතුරු ලැබී ඇත.

මෙවැනි ක්‍රියාවක් විමර්ශනයක් සිදුකරන රාජ්‍ය නිලධාරීන්ට අදාළව අල්ලස් ලබා ගැනීම හෝ අනීතික ප්‍රතිලාභ ලබා ගැනීම යන තත්වයකට අයත් විය හැකි බවට සැක පවතී.

අදාළ ස්ථානයේ CCTV කැමරා පද්ධතියක් පවතින බවත් එහි දර්ශන දින තුනක් ඇතුළත ස්වයංක්‍රීයව මැකී යන බවත් දැන ගැනීමට ලැබී ඇත.

එබැවින්,

එම CCTV දර්ශන වහාම සුරක්ෂිත කරගැනීම සඳහා කඩිනම් පියවර ගැනීම.

අදාළ රාජ්‍ය නිලධාරීන් විසින් අල්ලස් ලබාගැනීම හෝ අනීතික ප්‍රතිලාභ ලබාගැනීම සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කිරීම.

මෙම සිද්ධියට සම්බන්ධ සියලු පාර්ශවයන්ට එරෙහිව අල්ලස් හා දූෂණ නීති යටතේ නීතිමය පියවර ගැනීම. කරන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

මෙම කරුණු සම්බන්ධයෙන් සාධාරණ හා ස්වාධීන විමර්ශනයක් සිදු කර රටේ නීතිය ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

ස්තූතියි.

මෙයට විශ්වාසී,

.....................................

තිස්ස සෙනෙවිරත්න

දු.ක.අංකය: 0777803395